ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන උපාධි පාඨමාලාව - 3 වන මට්ටම
MCU 1204 - සංවිධාන සමාජ මනෝ විද්‍යාව
අවසාන පරීක්ෂණය - 2009
කාලය - පැය තුනයි

දිනය - 2009.02.01 වේලාව - පෙ.ව. 09.30 - ප.ව. 12.30 දක්වා

ප්‍රශ්න සංඛ්‍යාව - 06 පිටු ගණන- 01

උපදෙස් - ඕනෑම <u>ප්‍රශ්න පහක් (05)</u> සඳහා පමණක් පිළිතුරු සපයන්න.

01. (අ) සංවිධාන මනෝ විද්‍යාව යනු කුමක් ද? එය සංවිධාන මනෝවිද්‍යාවේ සම්භවයන් සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) මූලික මනෝ විද්‍යාව (Basic Psychology) සහ සංවිධාන මනෝ විද්‍යාව (Organizational Psychology) අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 10)

02. (අ) හැකියාවන් (abilities) , නිපුණතා පසුබිම (skills background) සහ ජනවිකාශ විචල්‍යයන් (demographic variables) මානව චර්යාව කෙරෙහි බලපෑම් කරන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 10)

(ආ) ඉගෙනුම් චක්‍රය (learning cycle) තුල උපකාර කරන ප්‍රධාන මනෝවිද්‍යාත්මක විචල්‍යයන් විස්තර කරන්න. (ලකුණු 10)

03. (අ) සංවිධානයක් තුල මානව අන්තර් පුද්ගල සමබන්ධතාවයන්ගේ වැඩ භූමිකාවෙහි ( work role) වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 06)

(ආ) යාන්ත්‍රික (mechanistic) සහ ස්වභාවික පද්ධති (Organic System) සංවිධානවල ප්‍රධාන චරිත ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ඇ) විධිමත්කරණය (Formalization) සහ මධ්‍යගතකරණය (Centralization) ට අදාළව සංවිධාන ව්‍යුහය ඔබගේ උදාහරණ සමග පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. (අ) කණ්ඩායම් සමාජකරණය (group socialization) යන්න නිර්වචනය කර සමාජකරණ ක්‍රියාවලිය (Process of Socialization) හි ප්‍රධාන පියවරයන් සුදුසු උදාහරණ සමග පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) විධිමත් (Formal) කණ්ඩායමක් සහ අවිධිමත් (Informal) කණ්ඩායමක් අතර ප්‍රධාන වෙනස්කම් පැහැදිලි කර සංවිධානයකට අවිධිමත් කණ්ඩායම් මගින් ලැබෙන වාසි තුනක් සාකච්ජා කරන්න. (ලකුණු 10)

05. (අ) සන්නිවේදන විධි (Forms of Communication) යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? වාචික හා වාචික නොවන යන මූලික සන්නිවේදන විධි දෙක අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) සංවිධානයක ඵලදායකත්වය සහ කාර්යක්ෂමතාවය උපරිම කිරීම සඳහා කළමනාකරුවකු සංනිවේදන ව්‍යුහය (Communication Structure) සංවිධානය කරගත යුත්තේ කෙසේ ද? (ලකුණු 10)

06. (අ) හර්ස්බර්ගේ ද්විසාධන අභිප්‍රේරණ න්‍යාය (Herzberg's Two Factor Theory of Motivation) විවේචනාත්මකව සාකච්ජා කරන්න. (ලකුණු 10)

(ආ) සංජානනය (perception) යනු කුමක් ද? සංජානනය සඳහා බලපෑම් කරන සාධක සාකච්ජා කරන්න. (ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි. -